# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා , ව්‍යාපාර සංවර්ධන හා ඌණ උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார, நுண்நிதிய, சுயதொழில், வியாபார அபிவிருத்தி மற்றும் கீழுழைப்பு பயன்பாட்டு அரச வளங்கள் அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samadhi, Household Economy, Micro Finance, Self Employment, Business Development and Underutilized State Resources Development


| මගේ අංකය / எனது இல / My No | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி / Date |
|---|---|---|
| DSD/HO/02/AD/05/SDO/EB/2020 | ................................ | 2021.12.30 |

සියළුම දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂවරුන් වෙත.

**<u>සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමෘද්ධි කළමනාකරු (MN-4) තනතුර සඳහා වන 02 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය</u>**

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණය (MN-04) සමෘද්ධි කළමනාකරුවන් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන අනුව පැවැත්විය යුතු දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2022 වර්ෂයේ දී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

02. ඒ සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදනය මෙම දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කර ඇති අතර, එහි පිටපතක් ඔබගේ කාර්යාලයේ ප්‍රදර්ශණය කිරීමට හා අදාළ නිලධාරින් දැනුවත් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි. දැනට සේවයේ යෙදී සිටින පහත සඳහන් නිලධාරින්ට මෙම විභාගය සඳහා අයදුම් කළ හැක.

- මේ වන විට MN-4 සමෘද්ධි කළමනාකරු තනතුරේ II ශ්‍රේණියේ හෝ III ශ්‍රේණියේ සිටින සියළුම නිලධාරින්

03. 02 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ විෂය නිර්දේශය (ඇමුණුම 01 මගින් දක්වා ඇත)

04. ඔබ දිස්ත්‍රික් කාර්යාලයේ / ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සේවය කරන 02 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා පෙනී සිටීමට අපේක්ෂා කරන නිලධාරින්ට මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රය සම්පූර්ණ කර 2022.01.21 දිනට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් මා වෙත එවීමටත් එම අයදුම්පත තැපෑලට යොමු කිරීමට පෙර මෙම දෙපාර්තමේන්තුවෙහි පාලන අංශයේ samurdhicadre@gmail.com යන විද්‍යුත් ලිපිනයට යොමු කිරීමට අදාළ නිලධාරින් වෙත උපදෙස් ලබාදෙන මෙන් වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි. (ලියාපදිංචි තැපෑලෙන් අයදුම්පත යොමු කිරීමේ දී ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරෙහි "සමෘද්ධි කළමනාකරුවන් සඳහා වන 02 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය" යන්න සඳහන් කරන්න.)

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-

| | | | |
|---|---|---|---|
| 01. | ලේකම්, සමෘද්ධි ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | - | කා.දැ.ගැ.ස. |
| 02. | ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | - | දැ.ගැ.ස. |
| 03. | ප්‍රධාන ගණකාධිකාරී, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | - | දැ.ගැ.ස./අ.ක.ස. |


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |
| | | Hot Line :0112-889007 | | | |